ශීර්ෂය 311- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 311- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා

සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පාරිභෝජ්‍ය භාණ්ඩ ලෙස හඳුනාගත හැකි ඉතා අඩු වටිනාකමින් යුත් භාණ්ඩ වසර ගණනාවක් තිස්සේ මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.	අංක 2/ 2019 හා 2019 ජූනි 04 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මගින් 04/2018 චක්‍රලේඛය 03 හා 04 ඡේද ඉවත් කර ඇති බැවින් මූල්‍ය නොවන වත්කම් සඳහා සීමාවක් අදාල නොවනු ඇත.	පාරිභෝජ්‍ය භාණ්ඩ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ii)	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාලව 2024 වර්ෂයේ මාර්තු මාසයේ දී අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්, 2024 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොමැති අතර එම වත්කම් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් තුල ඇතුලත්ව තිබුණි.	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාලව අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් Cigas වැඩසටහනේ හඳුනා ගැනීමේ කටයුතු සිදුකරන අතර**,** ඉදිරියේ දී ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4 වන වගන්තිය ප්‍රකාරව 2018 පසු විශ්‍රාම හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය මුදලක් අත්තිකාරම් බී ගිණුමෙහි නොදැක්වීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවේ මියගිය සහ විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 352,311 ක් අයකර නොගෙන අත්තිකාරම් බී ගිණුමෙහි දක්වා තිබුණි.	මෙම නිලධාරීන්ගේ මරණ පාරිතෝෂිතය ගෙවීම සඳහා අදාල ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර මරණ පාරිතෝෂිතයෙන් නිලධාරීන්ට අයත් ණය ශේෂයන් අයකර ගත්විට අත්තිකාරම් **'බී'** ගිණුමේ හිඟ ණය ශේෂයන් පියවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත.	නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ විශ්‍රාම යෑමට පෙර නිරවුල් කරගත යුතු අතර තවදුරටත් නිරවුල් නොවූ ණය ශේෂ නොපමාව අයකර ගත යුතුය.

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ස්ථාවර වත්කම් ලේඛනය		
2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි.	අපහරණය කළ වත්කම් Cigas වැඩසටහනෙන් ඉවත් කළ පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන වන අතර, ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීම වෙනුවෙන් වසර 3 – 5 අතර කාලයක සිට ජනාධිපති කාර්යාලයෙන්, දෙපාර්තමේන්තුවට රු. 340,200 ක් අය විය යුතු වුවද එම මුදල අය කර ගෙන නොතිබුණි.	ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් අයකර ගත යුතු හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.	හිඟ මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලධන වැය විෂය අංක 311-1-1-1-2506 (ii) යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්කල රු.20,000,000 ක මුදලින් සියයට 99 ක්ම සංවර්ධනය කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර	ලෝලුගස්වැව නැවත පදිංචි කිරීමේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය උපදේශකවරුන් තෝරා ගැනීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ සඳහා උපදේශක ආයතනයක් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කල අතර 2024 වර්ෂය තුල මෙම කටයුතු නිම	ඉදිරි තත්වයන් පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදුකර සුදුසු සැලැස්මකට අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කළ යුතුය.

	නොගැනීම මෙම තත්වයට සෘජුවම හේතු වී තිබුණි.	කිරීමට නොහැකි වූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	
(ආ)	ආයතනය සතුව වාහන 14 ක් පවතින අතර වර්ෂය තුළ එම වාහන අළුත්වැඩියාව සඳහා රු. 5,820,973 ක වියදමක් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි. නමුත් මේ වන විට දෙපාර්තමේන්තුවේ කටයුතු කර ගැනීම සඳහා ධාවන තත්වයේ පවතින වාහන නොමැති අතර 2024 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් පිරිවැය වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන වල වාහන නඩත්තු පිරිවැය අතර රු. 1,252,217 ක හා ඉන්ධන පිරිවැය අතර රු. 464,246 ක වෙනසක් නිරීක්ෂණය විය.	ධාවන කටයුතු සඳහා සුදුසු තත්ත්වයේ පවතිනුයේ වාහන 09 ක් පමණක් වන අතර ඉතිරි වාහන 05 ගර්හිත තත්ත්වයේ පවතී. එම වාහන 09 ම ඇතැම් අවස්ථාවන්හි අලුත්වැඩියා තත්ත්වයේ ද පවතිනු ඇත. ඉදිරියේ දී නිවැරදිව වාර්තාව සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.	මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි වටිනාකම් ඇතුළත් කළ යුතුය.
(ඇ)	දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 5 කට වෙනත් වැය විෂයන්ගෙන් රු. 4,156,100 ක් මාරු කරගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 17 ත් සියයට 100 ත් අතර ප්‍රතිශතයක් විය. වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.	ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් වී නොතිබූ වැය විෂයයන් 07 ක් සඳහා රු.11,406,100 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කිරීම් සිදුකර ඇත.	වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි	මාසිකව ත්‍රෛමාසිකව මූල්‍ය හා කළමනාකරණ කමිටු රැස්වීම්, මූල්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබන අතර, මෙම රැස්වීම් අතරතුර දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලන සහ අභ්‍යන්තර පාලන කටයුතු සමාලෝචනය කරනු ලබන අතර, ඒ අනුව තීරණ ගනු ලැබේ. රැස්වීම් වාර්තා, අභ්‍යන්තර චක්‍රලේඛ සහ ලිපි මඟින් අභ්‍යන්තර සහ මූල්‍ය පාලනයන් දෙකම ඵලදායී ලෙස නිරීක්ෂණය කර සත්‍යාපනය කර ඇති බව සහතික කෙරේ. අභ්‍යන්තර පාලනයන් තහවුරු	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීත්වය පිළිබඳව සමාලෝචනය සිදුකර විගණකාධිපති වෙතද වාර්තා කළ යුතුය.

	සමාලෝචනයන් සිදුකල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පසුගිය වසරේ නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ, ලිපි සහ රැස්වීම් වාර්තා විගණකාධිපති වෙත පිටපත් කර නොමැති අතර, ඉදිරියේ දී එම වාර්තා ලිඛිතව වාර්තා කිරීමට කටයුතු කරනු ඇත.	
(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇතත්, සමහර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ දී මාස 1-3 ත් අතර කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී නියමිත කාල පරාසය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1)(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු සැපයිය යුතුය.
(ඇ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතුය.	ඵලදායී අභ්‍යන්තර විගණන කාර්යයක් සහතික කිරීම පිණිස දෙපාර්තමේන්තුව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ. 1. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම. 2. නිත්‍ය රැස්වීම් හරහා ශක්තිමත් කිරීම. 3. විගණන විමසුම් විමර්ශනය කිරීම සහ විසඳීම. 4. කාර්තුමය තක්සේරු වාර්තා සකස් කිරීම.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණනයේ ඵලදායී ක්‍රියාකාරීත්වය පිළිබඳව ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 1645		වාහන 14 ක ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරිපත් කර ඇති කරුණු වලට අදාලව මේ දක්වා ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ඇත.	යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව වාහන සම්බන්ධ ලොග් සටහන් පොත් පවත්වා ගත යුතුය.

(ආ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	-	චක්‍රලේඛයට අනුව වත්කම් හා පිරිවැය කළමණාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඊ-මේල් මඟින් යවා ඇති අතර, වත්කම් කළමනාකරණය සම්බන්ධව වරින් වර ලැබී ඇති චක්‍රලේඛ අනුව, අදාල තොරතුරු ඊ-මේල් මඟින් යවා ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් පිළිබඳ ආකෘති පත්‍ර අමාත්‍යාංශ ලේකම්ට පිටපතක් සහිතව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත භාරදී එහි මෑදු පිටපතද යැවීමට කටයුතු කළ යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

(i) අනුමත නොකළ ගෙවීම්

විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගෙවීම් සිදු කර තිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ව්‍යාපෘති කාර්යාල වල සේවය කරනු ලබන නිලධාරීන් විශ්‍රාම ගැන්වීමත් සමග තනතුර අහෝසි වන ලෙස බඳවා ගැනීම් සිදු කර ඇති අතර පූජා භූමි ශුද්ධ පවිත්‍ර කිරීම වෙනුවෙන් මුතියංගන කාර්යාලයේ නිලධාරීන් හට සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා කාලය වෙනුවෙන් අතිකාල ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති කාර්යාල වෙත ගෙවූ අතිකාල ගෙවීම් වියදම දෙපාර්තමේන්තුවේ මුළු වියදමින් සියයට 79 ක් එනම් රු. 5,640,333 ක් වී තිබුණු අතර එලෙස සතියේ සාමාන්‍ය වැඩ කරන දින වලදී සේවය කරනු ලබන කාලයට අතිකාල ගෙවීමට පැහැදිලි අනුමැතියක් නොතිබුණි.	නිවාඩු දිනවල සේවකයින්ට විශාල කාර්යභාරයක් සිදුකිරීමට ඇති නිසා එම දිනවල සේවකයින් අතිකාල සේවා ලෙස සේවය කිරීමට උනන්දුවක් නොදක්වයි. එම නිසා නිවාඩු දින අනිවාර්යය සේවා කොටසක් ලෙස පවත්වා ගත යුතුව ඇත. මේ නිසා සතිඅන්ත දිනවල අතිකාල ලෙස නොව, සාමාන්‍ය සේවාවන් ලෙස සේවා මුරයන් යටතේ පවත්වාගෙන යාම සිදුකර ඇත. මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමැතිය ලබාදී ඇති අතර, සියළු විධිවිධාන ඇතුලත් කර අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇත.	විධිමත් අනුමැතියකින් තොරව සතියේ වැඩකරන දිනයන් සඳහා අතිකාල ගෙවීමට අනුමත කළ හා ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් හා සැලැස්මක් සකස් කිරීම වුවත් වර්ෂ ගණනක් ගත වුවද එම කාර්ය ඉටු වී නොමැති අතර මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන අරමුණින් බැහැරව පූජා භූමි නඩත්තු කටයුතු හා පූජා භූමි ප්‍රකාශ යට පත් කිරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි. පූජා භූමි නඩත්තුව සඳහා සහ පූජා භූමි ලෙස ප්‍රකාශ කිරීම සඳහා විශාල පිරිවැයක් හා ශ්‍රමයක් දරනු ලබන අතර මානව සම්පත් ඌනතාවයක් දෙපාර්තමෙන්තුවේ පවතින අවස්ථාවක ප්‍රධාන අරමුණින් බැහැර වෙනක් කාර්යන් වෙත සම්පත් යෙදවීමට කටයුතු කර තිබුණි.	2023 ජුනි 14 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්තුමා හා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ පැවති සාකච්ඡාවේදී, 1. පූජාභූමි නඩත්තු කටයුතු හා පූජාභූමි ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය ඒ අයුරින්ම සිදුකරගෙන යෑමටත්, 2. දැනට පූජාභූමිවල සේවයේ නියුතු සේවකයන් විශ්‍රාම යාමෙන් පසු තනතුර අහෝසි වන පදනමින් කටයුතු කිරීම හා ඔවුන් විශ්‍රාම යාමෙන් අනතුරුව එම කාර්යයන් අදාල ආගමික ස්ථානයටම පැවරීමටත්, එම කාර්යයන් දෙපාර්තමේන්තුවේ කාර්යයක් සේ සලකා ඉටුකිරීමටත් තීරණය වී ඇත.	දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර සහ අරමුණු කෙරෙහි අවධානය යොමු කර ඒවා ළඟා කර ගැනීමට හැකිවන පරිදි සුදුසු සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

4.2 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබූ අතර එය 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් වලින්ම සමන්විත වූ අතර බොහෝ අයිතමයන් වල දිනය පමණක් වෙනස් කර දක්වා තිබුණි. එසේම එම අරමුණු බොහොමයක් සමාලෝචිත වර්ෂය තුල ඉටු වී නොතිබුණි.	ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම සඳහා සැලසුම් කල පරිදි අනුමැතිය ලබා ගැනීම නොහැකිවීම හා කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම වැනි කරුණු හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන අංශයන්ගේ ප්‍රමාදවීම් සිදුවූ බැවින් 2023 වසරේ ක්‍රියාකාරී සැලැස්මෙහි සමහර අංශයන් වෙනස් කර 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.	දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර සහ අරමුණු කෙරෙහි අවධානය යොමු කර ඒවා ළඟා කර ගැනීමට හැකිවන පරිදි සුදුසු සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

4.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කිරීම 2021 ඔක්තෝබර් 31 වන විට අවසන් කලයුතු වුවත්, 2019 සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්ම අවශ්‍ය සංශෝධනක් සිදුකර ප්‍රකාශයට පත් කිරීම 2024 අගෝස්තු 31 වන විට සිදු කිරිමට සැලසුම් කර තිබූ නමුත් එම කටයුතු සැලසුම් කල පරිදි ඉටු වී නොතිබුණි. ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්යමණ්ඩලයක් සහ විශේෂඥ දැනුම සහිත නිලධාරීන්ගේ හිඟකම මෙම තත්වයට සෘජුවම බලපා තිබුණි.	2020 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය ලබාදෙනු ලැබූ උපදෙස් අනුව 2019 වසරේ දී ගැසට් මගින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම සංශෝධනය කිරීම 2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස නිම කිරීමට සැලසුම් කරන ලදී. පනත ප්‍රකාරව 2023 වර්ෂයේ ජුනි මස 16 දින ජාතික භෞතික නිර්මාණ සභාව කොන්දේසි යටතේ අනුමැතිය ලබාදෙන ලදී. එසේ වුවද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රථම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු දැනුවත් කිරීමට සිදුවූ නිසා ඒ සඳහා කල්ගත වී ඇත.	පනත ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සහ ජාතික භෞතික සැලැස්ම නියමිත පරිදි සකස් කළ යුතුය.
(ආ)	අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2017 ආරම්භ කර 2024 දක්වා රු.මිලියන 1,053 ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ඉන් රු.මිලියන 13.5 ක් එනම් සියයට 1 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. මේ අනුව වසර 08 ක් ගත වුව ද අපේක්ෂිත අරමුණට ළඟා වීමට නොහැකි වී තිබූ අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා රාජ්‍ය ආයතන 04 කින් උපදේශකවරු බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත් එම කටයුතු නිසි පරිදි සිදු නොවීම මත එම කාර්යය ද අසාර්ථක වී තිබුණි.	මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ලෝලුගස්වැව නව නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම සඳහා උපදේශක ආයතනයක් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර, 2025 මැයි 31 දින තෝරාගනු ලැබ ඇති උපදේශක ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කිරීමට සැලසුම් කර ඇත.	අයවැයෙන් වෙන්වන ප්‍රතිපාදන උපරිම වශයෙන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුය.

(ඇ)	2023 මෙන්ම 2024 වර්ෂය තුලදී මධ්‍යම, ඌව හා නැගෙනහිර යන පලාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2024 වර්ෂය අවසාන වන විටත් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණු අතර මධ්‍යම පලාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද එයද සිදුකර නොතිබුණි. කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබු අතර සැලසුමකින් තොරව නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් විධිමත්ව නොමැතිවීම සහ පාරිසරික ගැටළු ඇති වීමට එය හේතු වී තිබුණි.	සැලසුම් කළ පරිදි ජාතික භෞතික සැලැස්ම නිම කිරීමේ කටයුතු නිම කිරීමට නොහැකි වූ බැවින් ඌව පළාත් කලාපීය භෞතික සැලැස්ම සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. නැගෙනහිර හා මධ්‍යම පළාත් කලාපීය සැලසුම් කටයුතු මේ වනවිට අවසන් වෙමින් පවතින අතර එම සැලසුම් කාර්මික උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබාගැනීම සඳහා සැලසුම් කර ඇත.	සැලසුම්ගත කාර්යයන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය
(ඇ)	පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේ නම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සමාලෝචිත වර්ෂය තුල විහාර 104 ක් පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් වර්ෂය තුල දී එයින් විහාර 91 ක කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.	අදාල පියවරයන් අනුගමනය කිරීමේ දී ආගමික ස්ථානයක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගතවනු ඇත.	- එම -
(ඉ)	මධ්‍යම පාරිසරික අධිසංවේදී ප්‍රදේශ සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා කටයුතු සිදුකිරීමට අදාල උප කාර්යයන් 15 ක් සැලසුම් කර තිබුණද වර්ෂය තුළ එම උප කාර්යයන් කිසිවක් සාක්ෂාත් කර ගෙන නොතිබුණි.	මධ්‍යම පාරිසරික අධිසංවේදී ප්‍රදේශ සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට අදාල උපකාර්යයන් සකස් කරමින් පවතී.	- එම -
(ඊ)	2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති 2024 වර්ෂයේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි 06 ක් 2025 වසරේ ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි ලෙස තවදුරටත් නම් කර තිබුණි.	පූජාභූමි ගැසට් කිරීමේ කාර්යය පියවර කීපයකදී රාජ්‍ය ආයතන කීපයක් වෙතින් ඉටුවන බැවින් ඒ සඳහා එක් වසර කිහිපයක් කාර්යසාධන වාර්තාවට ඇතුලත් කිරීමට සිදුවන අවස්ථා ඇත.	- එම -

4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් අංක CGO/NFAMS/01/03 දරන 2024 මැයි 21 දිනැති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇමතු ලිපිය අනුව 2024 අගෝස්තු 31 දිනට පෙර වාහන 05 ක් අපහරණය කල යුතුව තිබුණද වර්ෂය අවසාන වන තෙක් එම වාහන අපහරණය කර නොතිබුණි	අපහරණය කළයුතු වාහන පිළිබඳ තීරණයක් ගැනීමට කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව අනුව වාහන අපහරණය සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරනු ඇත.	වාහන අපහරණ කටයුතු චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුළදී සිදු කළ යුතුය.
(ආ)	දෙපාර්තමේන්තුව විසින් වර්ග අඩි 15054 ක් සඳහා වූ කාර්යාල ඉඩකඩ වෙනුවෙන් වාර්ෂිකව රු.39,328,876 ක කුලී ගෙවමින් පරිශ්‍රයක් නඩත්තු කරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2018 වසරේ සිටම කාර්යාල පරිශ්‍රය පාටිෂන් කර ඊට අදාල කාර්යාල උපකරණ වෙන්කර තබා ගෙන තිබුණි. මෙම වත්කම් මෙන්ම ප්‍රධාන කාර්යාලයේ ද්විතියික හා විධායක මට්ටමේ නිලධාරීන් 71 දෙනෙකුගෙන් සමන්විත මුළු කාර්ය මණ්ඩලය 85 දෙනෙකුට අවශ්‍ය ප්‍රමාණයට වඩා කාර්යාල උපකරණ, පරිගණක උපාංග සහ මුළු පරිශ්‍රයෙන් 1/3 ක් පමණ වූ ඉඩකඩ ද ඌන උපයොජිතව පවත්වා ගෙන ගොස් තිබුණි.	භෞතික සැලසුම් සකස් කිරීමට සක්‍රිය දායකත්වයක් දක්වනු ලබන්නේ අනුමත කාර්ය මණ්ඩලය තුල ද්විතීයික, තෘතීක හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් වේ. පවතින පුරප්පාඩු 142 අතුරින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක් අධ්‍යක්ෂ තනතුරු 04 ක් සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 12 ක් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. සැලසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්, රියදුරු හා කාර්යාල කාර්ය සහායක පවතින පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.	සම්පත් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට හැකි පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම තුළින් වත්කම්වල ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගත යුතුය.
(ඇ)	දෙපාර්තමේන්තුව සතුව භාවිතයෙහි ඉඩම් 17 හා ගොඩනැගිලි 18 ක් පැවතියද තක්සේරු කර වටිනාකමක් හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කර තිබුණේ ඉඩම් 8 හා ගොඩනැගිලි 11 ක් පමණි. මින් ඉඩම් 11 ක් සඳහා හිමිකම් ඔප්පු ලබා ගෙන නොතිබුණි.	ඉඩම්වල නිරවුල්භාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉඩමේ සැලැස්ම/පිඹුර ලබාගත හැකි අතර ඒ අනුව තක්සේරුව සිදුකල හැකි වේ. ඉන් අනතුරුව ඊට සමගාමීව හිමිකම් ඔප්පුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ලබාගත හැක.	ඉඩම් ඔප්පු ලබාගැනීමට නොපමාව කටයුතු කල යුතු අතර ඉඩම් හා ගොඩනැගිලිවල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	මහියංගණය සංචාරක බංගලාව පවතින භූමියේ දෙපාර්තමේන්තුවට අයත් යැයි සැලකෙන එහෙත් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට	මෙම ගොඩනැගිල්ලේ බිම සකස් කිරීම සහ වැසිකිළි අළුත්වැඩියා කර යම් ප්‍රමාණයක ඌන උපයෝජනය අවසන් කර සංචාරක බංගලාවක් ලෙස	දෙපාර්තමේන්තුව සතු වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනයට

	නොගන්නා ඌන උපයෝජිත ගොඩනැගිල්ලක් පැවතුනි.	කණ්ඩායම් වලට ලබා දීමට මෙම වසරේ සිදු කිරීමට බලාපොරොත්තු වේ. ඉදිරි වසරේ දී අනෙකුත් අළුත්වැඩියා කටයුතු කිරීමට නියමිතය.	කටයුතු කළ යුතුය.
(ඉ)	දෙපාර්තමේන්තුව භාවිතයේ පවතින මුදල් අමාත්‍යාංශයට අයත් අංක 65-0690 දරන වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	අංක 65-0690 දරන වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන වත්කම් නියමිත පරිදි පවරා ගැනීමට හා ගිණුම්ගත කිරීමට නොපමාව කටයුතු කළ යුතුය.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණ	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු වුවද නිලධාරීන් 4 දෙනෙකු ඇප තබා නොතිබූ අතර මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ ඇප ආඥා පනතට හා මුදල් රෙගුලාසි 880 ට අනුව ඇප තැබිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප තැන්පත් සිදු කිරීමට කටයුතු කර ඇත.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය.

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන විමසුම පිළිබඳ විස්තරය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ විගනණයට අනුකූලව නිකුත් කරන ලද විගණන විමසුම් සඳහා දෙපාර්තමේන්තුව විසින් නියමිත කාල පරාසය තුළ පිළිතුරු ලබා දී නොතිබුණු අතර ඒවාට පිළිතුරු ලබා ගැනීමට මාස 1-3 අතර කාලයක් ගතවී තිබුණි.	දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇතත් සමහර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ දී මාස 1-3 ත් අතර කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී නියමිත කාල පරාසය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට සටහන් කර ගෙන ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1)(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු සැපයිය යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 02/2017 හා 2017 ජුලි 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම, ආයතනයේ කාර්යභාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීම යන තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධීකරණය කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි.	ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවට අදාළ තිරසර සංවර්ධන අරමුණු හා තිරසර නිමැවුම් දර්ශක හඳුනාගෙන ඇති අතර එම අරමුණු සබැඳි සමහර පාර්ශව හඳුනාගෙන දැනුවත් කිරීම් කර ඇති අතර සමහර සබැඳි පාර්ශව හඳුනා ගැනීමේ කටයුතු සිදුකරමින් ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 287 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 145 ක් වූයෙන් පුරප්පාඩු 142 ක් විය. මෙය නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට නොහැකි වීමට සෘජුව බලපා තිබුණි.	භෞතික සැලසුම් සකස් කිරීම සඳහා සෘජුවම දායකත්වය ලබාදෙන තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. සැලසුම් ශිල්පීන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. ඊට අමතරව පුරප්පාඩුව පවතින අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.	කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට හා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.
(ආ)	රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 18/2001 හා 2001 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව දීප ව්‍යාප්ත සේවාවල සේවය කරනු ලබන නිලධාරීන් වර්ෂය 05 න් 05 ට ස්ථාන මාරුවීම් සිදුකල යුතු වුවද වසර 05ට වැඩි නිලධාරින් ස්ථාන මාරු නොලැබ දෙපාර්තමේන්තුවේ තවදුරටත් සේවය කරමින් පැවතුණි.	දැනට මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් 07 ක් සේවය කරන අතර, ඉන් මෙම දෙපාර්තමේන්තුව තුල අවුරුදු 05 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් 05 ක් සිටින අතර නිලධාරීන් දෙදෙනෙකු පමණක් අවුරුදු 09 ක් හා 08 ක් සේවය කරමින් පවතී.	චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරුවීම් සිදුකළ යුතුය.